# කොවිඩ් 19 සති පාසල - සබරගමුව පළාත

# නිවිතිගල අධ්‍යාපන කලාපය

| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 9 ශ්‍රේණිය | නොවැම්බර් - තෙවන සතිය |
|---|---|---|

**පුණරීක්ෂණ අභ්‍යාස - 6 වන පාඩම -තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ සමාජය**

- *මෙම කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මේ සඳහා ඔබ මේ වන විට අධ්‍යයනය කර අවසන් කර ඇති 6 වන පාඩම වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සමාජය යන පාඩම අධ්‍යනය කර පහත ක්‍රියාකාරකම් වල නිරත වන්න.*
- *මේ සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- *මෙම ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ ද සහාය ලබා ගන්න.*
- *ඔබගේ පිළිතුරු හෝ නිර් මාණ* ***තෙවන සතිය - ICT - ඔබේ නම හා ශ්‍රේණිය*** *ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස් කර ගන්න.*

01) Covid 19 නිසා අතපසු වූ ඉගෙනීමේ කටයුතු තාක්ෂණය ආධාර කරගෙන ඉටු කර ගත් ආකාරය ලියන්න.

02) ඔබේ හොඳම මිතුරා සිටින ප්‍රදේශය හුදෙකලා කර ඇති විටක , ඔහුගේ ආච්චි අම්මාගේ බෙහෙත් ඖෂධ අවසන් වී ඇති බව ඔබට පවසයි. එවිට ළඟම ඇති ඖෂධ හලෙන් එම බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට තාක්ෂණය භාවිතා කරන ආකාරය පිළිබඳව ලබා දෙන උපදෙස් පියවර ලෙස ලියන්න.

03) මාර් ග ගත ආකාරයට (online) ආහාර ද්‍රව්‍ය විකුණන වෙළඳ සැලක් සඳහා ගැලපෙන වෙළඳ දැන්වීමක් අදින්න.

04) මාර් ග ගත සාප්පු සවාරි (online shopping) සහ මිලදී ගැනීමේ කටයුතු සිදු කරන ආයතන වල වෙබ් අඩවි නාමාවලියක් ලියන්න.

05) මෙම සතිය තුල ඔබේ පවුලේ සාමාජිකයින් තාක්ෂණය භාවිතා කර සිදු කරන ලද කාර්යයන්
හැකි තරම් ලියන්න.

***** ධනූජා හර් ෂණී - ර/ හොරහින්ඇල්ල සුමන විද්‍යාලය *****